# වාහන, යන්ත්‍ර උපකරණ හා පාරිභෝගික භාණ්ඩ සඳහා කල්බදු පහසුකම්

අප ආයතනය මඟින් වාහන, යන්ත්‍ර උපකරණ හා පාරිභෝගික භාණ්ඩ සඳහා කල්බදු පහසුකම් සපයනු ලැබේ.

- **වාහන** - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරනු ලබන සියළු වාහන කාණ්ඩ.
  උදා - මෝටර් කාර්, මෝටර් වෑන්, මෝටර් ට්‍රක්, මෝටර් ලොරි, මෝටර් කෝච් වාහන (බස්), ත්‍රී වීලර්, මෝටර් බයිසිකල් ආදිය සඳහා

- **යන්ත්‍ර උපකරණ හා පාරිභෝගික භාණ්ඩ** - අපගේ නම්‍යශීලි ණය නිර්ණායක සපුරාලනු ලබන සියළු පුද්ගලයින් හා ව්‍යාපාර සඳහා අප විසින් ආකර්ෂණීය ප්‍රතිලාභ සපයනු ලැබේ.

  - ඔබ විසින් තෝරාගන්නා වාහන/යන්ත්‍ර මාදිලිය මත උපරිම ණය මුදල හා ආපසු ණය ගෙවීමට ලබා දෙන කාලය වෙනස් වේ.
    උදා - ලියාපදිංචි නොකළ අලුත් කාර්, වෑන් සඳහා වාරික 72 ක (අවුරුදු 06) උපරිම ණය ආපසු ගෙවීමේ කාල සීමාව
    ලියාපදිංචි කළ කාර්, වෑන් සඳහා වාරික 60 ක (අවුරුදු 05) උපරිම ණය ආපසු ගෙවීමේ කාල සීමාව
  - ඔබගේ ආදායම් ලැබීමේ රටාව මත මාසිකව සමාන මුදලක් හෝ කලින් සැලසුම් කළ ආකාරයට හෝ ණය ආපසු ගෙවීමේ හැකියාව
  - ඔබ අප සමඟ ලීසිං පහසුකම් ලබා ගැනීමට පෙර අදාළ ගිවිසුමට අදාළ මාසික වාරිකය, වෙනත් ගාස්තු අය කිරීම් හා කොන්දේසි හා නියමයන් අපගේ නිලධාරීන් විසින් පැහැදිලි කරනු ලැබේ.

- **දේපළ ණය -** අප ආයතනය මඟින් ඔබගේ පුද්ගලික හා ව්‍යාපාර මුදල් අවශ්‍යතා සඳහා ණය පහසුකම් සපයනු ලැබේ.
  උදා - ඔබට දේපලක් මිලදී ගැනීමට, ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධනය ඉහළ නැංවීමට, ව්‍යාපාරය පුළුල් කර ගැනීමට, ඔබගේ දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මුදල් ආයෝජනයට අවශ්‍ය නම් ඒ සඳහා හොඳම විසඳුම දේපළ ණයයි.

  - ඔබ විසින් ණය මුදල ආපසු ගෙවීමේ හැකියාව හා අවශ්‍ය ලියකියවිලි මේ සමඟ ඉදිරිපත් කළ යුතුයි.
  - දේපළ ණයක් ලබා දීමේදී අප විසින් නිශ්චල දේපළ (ඉඩම්/ගොඩනැගිලි) සඳහා ප්‍රමුඛතාව ලබා දේ.
  - අප විසින් ලබා දෙනු ලබන උපරිම ණය මුදල වනුයේ වෙළෙඳපළ වටිනාකමින් 70% ක් හා උපරිම ණය ආපසු ගෙවීමේ කාල සීමාව මාස 60 (අවුරුදු 05) කි.
  - අප ආයතනය විසින් ඔබ හා ණය ගිවිසුමට එළඹීමට පෙර ඊට අදාළ වාර්ෂික පොළී අනුපාත, ප්‍රමාද ගෙවීම් පොළී අනුපාත, ලියවිලි ගාස්තු සහ වෙනත් අදාළ ගාස්තු අපගේ නිලධාරීන් විසින් ලිඛිතව පැහැදිලි කරනු ලැබේ.

- **චක්‍රීය ණය (Revolving Loan)**

  - ඔබගේ පහසුව සඳහා අපගේ සේවාවන් සකස් කර ඇත. මෙම ණය පහසුකම ලබා දෙන්නේ වාහන ඇප ලෙස තබා ගෙනය.
  - සාමාන්‍ය කල්බදු ගිවිසුමකට වඩා මෙම ණය පහසුකමේ නියමයන් හා කොන්දේසි නම්‍යශීලි වේ. මාසයට අදාළ අවම පොළී මුදල අනුව ඔබට ගෙවීම් තීරණය කළ හැක.
  - ඔබගේ ණය කාල සීමාව තුළ අදාළ ණය මුදල සම්පූර්ණයෙන් හෝ කොටස් ලෙස ගෙවා නිම කළ හැක. ණය පහසුකම කලින් අවසන් කිරීමේදී ඊට අදාළව කිසිඳු අමතර මුදලක් අය නොකෙරේ.

- **ණය සාධනය**

  - ඔබ ව්‍යාපාරයේ කාරක ප්‍රාග්ධනය හෝ මූල්‍ය තත්වය වැඩි දියුණු කිරීම සඳහා ඔබට ඇති හොඳම විසඳුම වනුයේ මෙම ණය පහසුකමයි. ඔබට සුවිශේෂී ප්‍රතිලාභ මෙම ණය පහසුකම සමඟ භුක්තිවිඳිය හැක.
  - අප විසින් ඔබ ව්‍යාපාරයේ ණය ගැනුම්කරුවන් මිලදී ගෙන ඒ සඳහා ඔබට අත්තිකාරම් මුදලක් ලබා දෙනු ලැබේ. එමඟින් ඔබගේ ව්‍යාපාරයේ හොඳ මූල්‍ය තත්වයක් පවත්වා ගත හැක. ඔබ සමඟ කලින් ගිවිසගත් ගාස්තු මත අපගේ සියළු ණය සාධන සේවාවන් ඔබට සපයනු ලැබේ. ණය මුදලට අදාළ කොන්දේසි හා නියමයන් ඔබ විසින් ගිවිසුමට ඇතුළත් වන අවස්ථාවේදී ලිපියක් මඟින් දැනුම් දෙනු ලැබේ.